## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 16 කට පෙර විශ්වවිද්‍යාලය ආරම්භකරන අවස්ථාවේදී විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබුණු ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල, නඩත්තු අංශ ගොඩනැගිල්ල, නිල නිවාස 33 ක් හා එහි ඉඩම හා වසර 03 කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගනු ලබන ව්‍යවහාරික විද්‍යා පීඨ හා ශිෂ්‍ය නේවාසිකාගාර භූමිය, කෘෂිකර්ම විද්‍යා පීඨ ගොවිපල භූමිය, සහ වෛද්‍ය පීඨයට අදාල ඉඩම්ද ඇතුළු අක්කර 220 කට අධික ඉඩම් සමාලෝචිත වර්ෂයේදීද පවරාගෙන නොතිබීම හේතුවෙන් ඒවායේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය විසින් කුළී පදනම මත ලබාගත් නිවාස කුලී වෙනුවෙන් ඉදිරි වර්ෂයට ගෙවන ලද රු.423,766 ක නිවාස කුලී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙර ගෙවීමක් ලෙස දක්වා නොතිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස තිබුණි. ඒ හේතුවෙන් වියදම් හා ඉදිරියට කළ ගෙවීම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) කෘෂි පීඨ ගොවිපල II අදියර හා වෛද්‍ය හා කෘෂිකර්ම පීඨවල අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවලට සචලිකරණ අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණු එකතු වටිනාකමේ රු.2,469,500 ක් වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන්ම අයකර ගෙන තිබුණද එම වටිනාකම් තවදුරටත් සචලිකරණ අත්තිකාරම් යටතේ දක්වා තිබීමෙන් එම ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, කෙරීගෙන යන වැඩ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඇ) කෘෂිකර්ම පීඨය පුළුල් කිරීමේ කටයුතු සඳහා අක්කර 15 ක පමණ ඉඩමක් අත්පත් කරගැනීම වෙනුවෙන් 2011 නොවැම්බර් 30 දින මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය ලේකම් වෙත තැන්පත් කරන ලද රු.7,200,000 ක මුදල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ඉඩම් අත්පත් කරගැනීමේ තැන්පත් ලෙස නොපෙන්වා සචලිකරණ අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(ඉ) සායනික ගොඩනැගිල්ලේ විශේෂිත කාර්යයන් නිම කිරීම වෙනුවෙන් ලබාදී තිබූ සචලිත අත්තිකාරම් මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට පියවියයුතුව තිබූ ශේෂය රු.12,634,645 ක් වුවද, එය රු.36,197,357 ක් ලෙස සචලිත අත්තිකාරම් ගිණුමෙහි දක්වා තිබීම නිසා එම ගිණුම රු.23,562,712 ක් වැඩියෙන්ද, කෙරීගෙන යන වැඩ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඊ) සායනික ගොඩනැගිල්ලේ විශේෂිත කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ කොටස් බිල්පත් මගින් ගෙවූ මුළු වටිනාකම රු.60,447,575 ක් වුවද, ගිණුම් වාර්තා තුළ එය රු.31,286,915 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුම රු.29,160,660 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2012 වර්ෂය සඳහා පර්යේෂණ වියදම් වලට ප්‍රතිපාදනය කර තිබූ රු. මිලියන 07 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබියදී සම්පූර්ණ මුදල වූ රු.මිලියන 07 ආදායම් වියදම් ප්‍රකාශයට (මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට) හර කොට පර්යේෂණ අරමුදලට බැර කර තිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවස්ථා 17 ක දී තැන්පත් කර මාස 03 ත් වර්ෂ 04 ත් අතර පරාසයක කාලයක් ඉකුත් වී තිබුණු විවිධ අත්තිකාරම්, සුළු මුදල් හා සැපයුම් අත්තිකාරම් වශයෙන් එකතුව රු.1,945,708 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂය 2012 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(ආ) 2008 පෙබරවාරි 27 දින කථිකාචාර්යවරයකුට ලබාදී තිබුණු රු.25,000 ක් වූ පර්යේෂණ අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා රු.2,587,986 ක් වූ ස්ථාවර වත්කම්, විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.2.4 නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| 99 (i) (ඇ) වගන්තිය | විශ්වවිද්‍යාලයට අයත් වූ කවර ප්‍රභවයකින් හෝ අත්කර ගනු ලැබුවා වූ සියලුම මුදල් ලැබීම් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර වියදම් දැරියයුතු වුවද, විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන බාහිර ඉංග්‍රීසි පාඨමාලා සහ කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවල වියදම් දැරීමෙන් පසු අතිරික්තයෙන් සියයට 10 ක් උපකුලපති අරමුදලටද ඉතිරිය අදාල පාඨමාලා සංවර්ධන අරමුදල්වලටද බැර කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ රඹෑව හා මිහින්තලේ පරිශ්‍රයේ පිහිටි පවුල් ඒකක හා තනි ඒකක නිවාස වල ජල බිල්පත් ගාස්තු රු.510,925 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණු නමුත් ඒවායේ පදිංචිකරුවන්ගෙන් රු.73,128 ක මුදලක් පමණක් අයකර තිබීම හේතුවෙන් පෞද්ගලික පරිහරණය සඳහා ලබාගෙන තිබුණු ජලය වෙනුවෙන් රු.437,797 ක් සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 104 (1), 104 (3), 104 (4) | 2010 සහ 2011 වර්ෂවලදී අවස්ථා 06 කදී විශ්වවිද්‍යාලය සතු වාහන අනතුරට පත්වීම නිසා එකතුව රු.872,927 ක අලාභයක් සිදු වී තිබූ අතර, එයින් රු.783,950 ක් රක්ෂණ ආවරණ යටතේද රු.88,977 ක් විශ්වවිද්‍යාල අරමුදලින්ද දරා තිබූ නමුත් අනතුරුවලට වගකිවයුත්තන් හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ

| | | |
|---|---|---|
| (i) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92, 1994 අගෝස්තු 03 දිනැති 26/92 (1) හා 2002 පෙබරවාරි 25 දිනැති අංක 2002 /01 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | සංචිතයේ ඇති රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම සඳහන් කළයුතු වුවද විශ්වවිද්‍යාලය සතු සංචිත වාහන 25 ක රාජ්‍ය ලාංඡනය හෝ විශ්වවිද්‍යාල ලාංඡනය සහ ආයතනයේ නම පින්තාරු කර නොතිබුණි. |
| (ii) | 2011පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අනුයුක්ත නිල වාහන හිමිකම් ඇති නිලධාරීන් තමාට ලබා දී ඇති මාසික ඉන්ධන සීමාව තුළ සිය රාජකාරි අවශ්‍යතා සපුරාගත යුතු අතර අතිරේක ඉන්ධන ලබාදිය හැක්කේ අදාල අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ඇතිව පමණක් වුවද එවැනි අනුමැතියකින් තොර උපකුලපතිගේ නිල රථය සඳහා සමාලෝචිත වර්ෂය තුළ අනුමත සීමාව ඉක්මවා රු.97,671 ක් වටිනා ඉන්ධන නිකුත් කර තිබුණි. |
| (iii) | 2009 අප්‍රේල් 16 දින අංක 09/2009 හා 2009 ජුනි 17 දිනැති 9/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණිම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළයුතු වුවද, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (iv) | 2002 ජුලි 30 දින අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කොන්ත්‍රාත් ගෙවීම් සමඟ එකතු කළ අගය මත බදු ගෙවීමේදී අදාල මාසයට පසු මාසයේ 15 දිනට පෙර එකී බදු මුදල් ගෙවීම් විස්තර විගණකාධිපතිට පිටපත් සහිතව දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා යැවිය යුතු වුවද, උද්‍යාන නඩත්තු සේවා වෙනුවෙන් ගෙවා තිබූ එකතු කළ අගය මත බදු රු.931,976 ක් ගෙවීමේදී ඉහත පරිදි කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (v) | 1997 ඔක්තෝබර් 17 දිනැති අංක 720 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ | |
| | 3(i) හා (ii) වගන්තිය | වැඩ බැලීමේ උපරිම කාලසීමාව මාස 03 නොඉක්මවිය යුතු වුවත් එයට පටහැනිව වර්ෂ 02 සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක් දක්වා නිලධාරීන් 10 දෙනකු වෙත වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණු අතර, එම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.228,804 ක් වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. ප්‍රධාන ආරක්ෂක නිලධාරී හා පුස්තකාලාධිකාරී තනතුරු 2013 ඔක්තෝබර් 11 දින වන විටත් පුරප්පාඩුව පැවැතුණි. |

1.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

නේවාසිකාගාර සඳහා මිහින්තලේ විශ්වවිද්‍යාල භූමියේ පිහිටි පොලිස් නිවාස පවරා ගැනීම වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් 2006 වර්ෂයේදී රුපියල් මිලියන 18 ක් ලබාදී තිබුණු නමුත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් එම පවරා ගැනීම සිදු කර නොතිබුණි. ඒ සඳහා ලබාදී තිබුණු මුදල, 2007 වර්ෂයේ සිට ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කර ඒ සඳහා ලැබුණු රු.9,243,577 ක පොලිය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් බිල් පියවීම වැනි වෙනත් කටයුතුවලට යොදාගෙන තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් රු. 24,064,637 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.150,923,949 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.126,859,312 ක වර්ධනයක් විය. මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය සඳහා මූලධන ප්‍රදානයන්ගේ ක්‍රමක්ෂය රු.176,257,079 කින් වැඩිවීම හා පුනරාවර්තන ප්‍රදානයන්ගේ රු.99,416,556 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත සඳහන් පරිදි විය.

(අ) විභාග ප්‍රතිඵල

(i) 2012 වර්ෂයේදී පැවැත් වූ අවසන් වසර විභාගය හා උපාධිය සමත්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | ව්‍යවහරික විද්‍යා පීඨය | කෘෂිකර්ම විද්‍යාපීඨය | කළමනාකරණ අධ්‍යයන විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් වසර විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 201 | 83 | 178 | 220 | 164 | 846 |
| පන්ති සමාර්ථ සහිතව සමත් සංඛ්‍යාව | 78 | 52 | 05 | 139 | 67 | 341 |
| සාමාන්‍ය සමත් සංඛ්‍යාව | 77 | 05 | 134 | 28 | 73 | 317 |
| මුළු සමත් සංඛ්‍යාව | 155 | 57 | 139 | 167 | 140 | 658 |
| අසමත් සංඛ්‍යාව | 46 | 26 | 39 | 53 | 24 | 188 |
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් උපාධිය අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය | 22.8% | 31% | 21.9% | 24% | 14.6% | 22% |

සමාලෝචිත වර්ෂයේ සියලු පීඨවල අවසන් වසර විභාගයට පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 846 ක් වූ අතර එයින් ශිෂ්‍යයන් 188 දෙනකු අසමත් වී තිබුණි. එය විභාගවලට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 22 කි.

(ii) 2007/2008 වර්ෂයේ සිට 2011/2012 වර්ෂය දක්වා බඳවාගැනීම් හා උපාධිය සමත්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | උපාධි ලබා පිට වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 2008 | 2008/ 2009 | 2009/ 2010 | 2010/ 2011 | 2011/ 2012 | 2007/ 2008 | 2008/ 2009 | 2009/ 2010 | 2010/ 2011 | 2011/ 2012 |
| වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | 180 | 181 | 184 | 180 | 180 | - | - | - | - | 140 |
| කෘෂිකර්ම විද්‍යාපීඨය | 113 | 107 | 108 | 95 | 72 | 54 | 91 | 55 | 64 | 57 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 160 | 216 | 173 | 196 | 207 | 89 | 92 | 69 | 115 | 155 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 225 | 275 | 337 | 330 | 302 | 154 | 114 | 181 | 188 | 167 |
| කළමනාකරණ අධ්‍යයන විද්‍යා පීඨය | 211 | 279 | 307 | 276 | 355 | 162 | 201 | 163 | 137 | 139 |
| | 889 | 1058 | 1109 | 1077 | 1116 | 459 | 498 | 468 | 504 | 658 |

කෘෂිකර්ම පීඨය සඳහා බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 2007/2008 වර්ෂයේ සිට 2011/2012 වර්ෂය දක්වා අඛණ්ඩව අඩුවීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂයේදී රජරට විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ මුළු පිරිවැය හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | කෘෂිකර්ම පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | කළමනාකරණ පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.) | 64,782,503 | 69,847,426 | 47,179,677 | 49,035,443 | 113,659,617 | 344,504,666 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 402 | 816 | 1234 | 1189 | 1074 | 4715 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.) | 161,551 | 85,597 | 38,233 | 41,241 | 105,828 | 73,066 |

කෘෂිකර්ම පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය වැඩි අගයක් ගන්නා අතර ඊට සාපේක්ෂව සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය ඉතා අඩු අගයක පැවතුණි.

(ඇ) පර්යේෂණ වියදම් හා පර්යේෂණ දීමනා ගෙවීම

(i) 2012 වර්ෂය වෙනුවෙන් පර්යේෂණ වියදම් වශයෙන් ප්‍රතිපාදිත මුදල රු. මිලියන 07 ක් වූ අතර 2012 වර්ෂයට අදාල පර්යේෂණ වෙනුවෙන් පර්යේෂණ ලිපි 2013 වර්ෂයේද ප්‍රදානය කර තිබුණි. ඒ අනුව 2012 වර්ෂය තුළ අනුමත පර්යේෂණවල ප්‍රගතියක් නිරීක්ෂණය වී නොතිබුණි.

(ii) 2011 වර්ෂය සඳහා පර්යේෂණ ප්‍රදානය කිරීමේ ලිපි 26 ක් කථිකාචාර්යවරු වෙත ලබාදී තිබුණු අතර, එයින් 22 දෙදෙනකු විසින් රු.1,254,550 ක මුදලක් 2012 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් ලබාගෙන තිබුණි. පර්යේෂණ කාල සීමාව තුළ 06 මසකට වරක් ලබාදිය යුතු ප්‍රගති වාර්තා කථිකාචාර්යවරු දෙදෙනකු විසින් පමණක් ඉදිරිපත් කර තිබුණි. විගණිත දිනය වූ 2013 මැයි මස වන විටද 2011 වර්ෂයේ අනුමත පර්යේෂණවලට අදාල අවසන් වාර්තා කිසිවකු ඉදිරිපත් කර නොතිබුණි.

(iii) කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට පිළිවෙලින් 2008 පෙබරවාරි 27 දින රු.25,000 ක්ද, 2010 ඔක්තෝබර් 06 දින රු.90,000 ක් ද පර්යේෂණ අත්තිකාරම් ලෙස ලබාදී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල පර්යේෂණ නිමකර නොතිබූ අතර, ලබාගත් අත්තිකාරම් ආපසු පියවීමටද කටයුතු කර නොතිබුණි.

(iv) පර්යේෂණ දීමනා ගෙවීම සම්බන්ධයෙන් 2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය ප්‍රකාරව පර්යේෂණ වාර්තා ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ හෝ පිළිගත් විද්‍යාත්මක ප්‍රකාශනයක පලවීම හෝ අදාල දර්ශනිකයන්ගේ සම්භාෂනයකට ( Symposium) ඉදිරිපත් කර පර්යේෂණ කමිටුව සැහිමකට පත්වීම මත පමණකි. එහෙත් 2011 සහ 2012 වසර වලට අදාල කිසිදු පර්යේෂණයක අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණු බැවින් පර්යේෂණ දීමනා ගෙවීම පිළිබඳ තීරණ හෝ අත්හිටුවීම පිළිබඳ තීරණ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව (Senate Research, Publication and Higher degrees Committee SRPHDC) විසින් ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ පර්යේෂණ දීමනා එකතුව රු.12,093,477 ක් විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සමාලෝචිත වර්ෂය තුළ සිසු නේවාසිකාගාර ලෙස බදු පදනමට ලබාගෙන තිබූ නිවාස 32 ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලි තක්සේරු කර ගෙන නොතිබුණි. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිවාස 19 ක් සඳහා තක්සේරු කරන ලද වටිනාකම රු.3,786,000 ක කුලියට වඩා සියයට 150 සිට සියයට 200 දක්වා පරාසයක එකතුව වූ රු.5,826,000 ක වැඩි මුදලකට බදු ගැනීම නිසා එම නිවාස 19 වෙනුවෙන් අනුමත තක්සේරු කුලියට වඩා රු.2,040,000 ක් වැඩිපුර කුලී ගෙවා තිබුණි.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගැනීම් ගිවිසුම් පත්‍රයේ 09 වන වගන්තිය අනුව වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අවසන් වීමෙන් අනතුරුව රාජකාරියට වාර්තා නොකළේ නම් එදින සිට වර්ෂයක් ඇතුලත ගිවිසුම් වටිනාකම ගෙවීමටද, වර්ෂයක් ඇතුළත ගෙවීමට නොහැකි වන්නේ නම් සියයට 12 ක වාර්ෂික පොලියක් ද සමඟ ගෙවියයුතු බවද අදාල ගිවිසුම්වල සඳහන්ව තිබුණු ව්‍යවහාරික විද්‍යා පීඨයේ ගිවිසුම් කඩකල ආධුනික කථිකාචාර්යවරයකු ගිවිසුම කඩකර 2012 දෙසැම්බර් 31 දින වන විට වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණත්, රු.1,631,991 ක් වූ ගිවිසුම් වටිනාකම හා රු.405,118 ක් වූ ඊට අදාල පොලි වටිනාකමද අයකර ගැනීමට කිසිදු නිතීමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

------------------------------------

වාර්ෂික පිරිවැය රු. මිලියන 13 ක් ඉක්මවන විශ්වවිද්‍යාලයේ උද්‍යාන නඩත්තුව සඳහා සිදු කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසු ලියකියවිලි වල ලංසුකරුවන් කිසිවකුට ලඟාවිය නොහැකි පහත සඳහන් කොන්දේසිය ඇතුළත් කර තිබුණි.

"රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පෞද්ගලික ආයතන සඳහා අක්කර 25 ට වඩා වැඩි උද්‍යාන නඩත්තු සේවා සතුටුදායක ලෙස සැපයීම සම්බන්ධයෙන් වසර 2005 - 2011 කාලපරිච්ඡේදය ආවරණය වන වසර 03 ක පළපුරුද්දක් ඇති ආයතනයක් වීම." මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) සපුරාගැනීමට අපොහොසත් ඉහත කොන්දේසිය ලංසු ලියකියවිලිවලට ඇතුළත්වීම නිසා උද්‍යාන නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවලදී පැවැති සියලු ලංසු කැඳවීම් වලදී ලැබී තිබු ලංසුවල අදාල කොන්දේසි සම්පූර්ණකළ කිසිදු ලංසුකරුවකු ඉදිරිපත් වී නොතිබුණි.

(ආ) ලංසු ඇගයීමේදි අවශ්‍ය සියලු අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ අවම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුගේ ලංසුව අක්කර 25 ට වැඩි උද්‍යාන නඩත්තු පිළිබඳ පළපුරුද්ද නොමැති බැව් දක්වා ප්‍රතික්ෂේප කර තිබු අතර දෙවන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුද එම කොන්දේසිය ඉටු කර නොතිබියදි මෙම විශ්වවිද්‍යාලයේ එකී කාර්යයන් පිළිබඳ පෙර පළපුරුද්ද මත පදනම්ව කොන්ත්‍රාත්තුව එම ආයතනයට පිරිනමා තිබුණි. අවම මිල ගණන් ඉදිපත් කල ලංසුකරුගේ ලංසුව ප්‍රතික්ෂේප කිරම හේතුවෙන් ගෙවීම් කිරමේදී 2012 මැයි සිට 2013 ජනවාරි දක්වා කාලපරිච්ඡේදයේ රු.1,708,064 ක් අලාභයක් විශ්වවිද්‍යාල අරමුදලට සිදු වී තිබුණි.

(ඇ) උද්‍යාන නඩත්තු ක්‍රියාවලියේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සකස්කළ මුළු පිරිවැය ඇස්තමේන්තුව පහත සඳහන් සාවද්‍ය අගයන් පදනම් කරගෙන තිබීම හේතුවෙන් එය ලංසු ඇගයීම සඳහා යොදා ගැනීම ඵලදායි නොවන බව නිරීක්ෂණය විය.

(i) ඇස්තමේන්තු සකස් කිරම සඳහා මිල ගණන් ලබාගන්නා මුලාශ්‍රය වන දිස්ත්‍රික් මිල නියම කිරමේ කමිටුව මුළු දිස්ත්‍රික්කයම සඳහා එකම මිලක් නියම කර තිබූ නමුත් ඇස්තමේන්තුවේ එකම වැඩ විෂය සඳහා විවිධ ස්ථානවල විවිධ මිල ගණන් යොදා ගෙන තිබුණි.

| ඇස්තමේන්තුවේ සඳහන් ස්ථානය | හෙක්ටයාර් 01 ක් සඳහා ගහකොළ කැපීමට ගෙවන ලද මුදල |
|---|---|
| | රු. |
| මිහින්තලේ පරිශ්‍රය | 8,029 |
| මිහින්තලේ ක්‍රීඩා පිටිය | 18,927 |
| කෘෂිකර්ම පීඨය | 65,833 |
| වෛද්‍ය පීඨය | 29,200 |

(ii) මුළු පිරිවැය ඇස්තමේන්තුවට අදාලව සකස් කළ මිල විග්‍රහයට අනුව (Rate Analysis ) සියලු අයිතමයන්ට අදාලව එකතු කළයුතු ලාභ හා පොදු කාර්ය පිරිවැය අනුපාතය සියයට 20 ක් වුවද මෙම ඇස්තමේන්තු සඳහා සියයට 35 ක ලාභ හා පොදු කාර්ය අනුපාතයක් ඇතුළත් කර තිබුණි.

3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 117 ක පුරප්පාඩු පැවතුණි.

අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| (i) | මහාචාර්ය | 28 | 04 | 24 |
| (ii) | කථිකාචාර්යවරු / ආධුනික කථිකාචාර්යවරු | 253 | 160 | 93 |
| | | 281 | 164 | 117 |

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 117 ට අමතරව කථිකාචාර්යවරු 23 දෙනෙකු දේශිය හා විදේශිය ශිෂ්‍යත්ව සඳහා අධ්‍යයන නිවාඩු ලබා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයෙන් බැහැර වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව 139 ක් වූ අතර, එය අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 49 ක් විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති අධික පුරප්පාඩු සංඛ්‍යාව හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු සඳහා දේශණ ගාස්තු වශයෙන් රු.7,412,798 ක් ගෙවා එම සේවාව ලබාගෙන තිබුණි.

අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 28 | 20 | 08 |
| (ii) | මාණ්ඩලික නොවන | 394 | 330 | 64 |
| | | 422 | 350 | 72 |

(ඇ) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණියට සමාලෝචිත වර්ෂය තුළ 11 දෙනෙකු බඳවාගෙන තිබූ අතර එම තනතුරට අදාල අනුමත විශ්වවිද්‍යාල බඳවාගැනීම් පටිපාටිය සහ 2004 දෙසැම්බර් 14 දිනැති අංක 854 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට පටහැනිව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සපයන ලද අයදුම්කරුවන් 53 දෙනෙකුගේ නාමලේඛනයක් පදනම් කරගෙන අදාල බඳවා ගැනීම් සිදු කර තිබුණි. අදාල

අයදුම්කරුවන් 53 දෙනා තෝරා ගන්නා ලද පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.6 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

(අ) දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.8,226,250 ක පිරිවැයක් දරා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී වැඩ නිම කර තිබුණි. 2013 සැප්තැම්බර් 11 වන විටද අපේක්ෂිත කාර්යයන් සඳහා භාවිතයට නොගෙන නිෂ්ක්‍රියව තිබුණි.

(ආ) මිහින්තලේ රාජ්‍ය බැංකු ශාඛාවක පවත්වාගෙන යන ගිණුමක රු.113,061 ක ශේෂයක් වසර 02 ක කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.

3.7 වාහන ඌන උපයෝජනය

විශ්වවිද්‍යාලය සතු සංචිත වාහන ඇනියෙහි වූ වාහන 03 ක් අළුත්වැඩියා නොකර ගාල් කර තැබීම නිසා සහ සංචිත වාහන 04 ක් පීඨාධිපතිවරුන්ගේ රාජකාරි සඳහා පමණක් භාවිතා කර තිබුණි. එම වාහන උපරිම කාර්යක්ෂමතාවයකින් ආයතනයේ කටයුතුවලට යොදා ගැනීමට නොහැකිවීමෙන් සමාලෝචිත වර්ෂයේදී කුලී පදනම මත වාහන 02 ක් යොදවා ගැනීමට රු.846,177 ක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.

3.8 ආර්ථික නොවූ ගනුදෙනු

භාණ්ඩ හෝ සේවා සැපයීම්වලට අදාල විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමේදී අදාල කොන්ත්‍රාත් ගිවිසුම සඳහා භාවිතා කළයුතු ගිවිසුම් ආකෘති පත්‍ර ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් අනුමත කර ඉක්ටැඩ් ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති බැවින් (ICTAD Publication Standard bidding documents ) ඒවා ගිවිසුම සඳහා භාවිතා නොකර විශ්වවිද්‍යාලය විසින් සපයාගන්නා සේවා 02 ක් වෙනුවෙන් ගිවිසුම් සකස් කිරීම සඳහා පෞද්ගලික නීතිඥවරයකුට රු.30,500 ක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2012 වර්ෂයේදී නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් 09 කින් 03 ක් සඳහා කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අභ්‍යන්තර විගණන ඒකකයට අනුමත කාර්ය මණ්ඩලය සහකාර අභ්‍යන්තර විගණක ඇතුළු තිදෙනෙක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණන ලිපිකරු තනතුර පුරප්පාඩුව පැවතුණි.

4.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම.

2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 අප්‍රේල් 29 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යවා තිබුණි.

4.3 නොවිසඳී ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ

(අ) 2011 ජනවාරි 04 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී දෙනු ලැබූ නියෝග ඉටුනොකළ අවස්ථා පහත විය.

| නියෝග අංකය | දෙන ලද නියෝගය | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 07 | විවිධ පාඨමාලාවලින් ලැබුණු මුදල් විශ්වවිද්‍යාලය අරමුදලට බැර කිරීම. | 2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලද විවිධ බාහිර පාඨමාලා වලින් ලැබුණු රු.27,970,984 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි. |
| 08 | මිහින්තලේ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවතින පොලිස් නිවාස විශ්වවිද්‍යාලයට නේවාසිකාගාර වශයෙන් පවරාගන්නා තෙක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මිලයන 18 ක මුදල් භාණ්ඩගාරගාර අනුමැතිය ලබාගෙන ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීම. | 2012 ඔක්තෝබර් වන විටත් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම අරමුදල් විවිධ ගෙවීම සඳහා යොදාගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| 14 | නිල නිවාස කුලී, ගාස්තු හා විදුලි බිල්පත් ගාස්තු පදිංචිකරුවන්ගෙන් අයකර ගැනීමට නියෝග කරන ලදි. | විශ්වවිද්‍යාලය සතු තනි ඒකක හා පවුල් ඒකක නිවාසවල ජල බිල්පත් සඳහා 2011 වර්ෂයේදී රු.896,613 ක්ද 2012 වර්ෂයේදී රු.437,797 ක්ද විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණි. |

5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර උපකුලපති වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) වාහන පරිපාලනය